# නැකැත්ගෙදර වෙද පරම්පරාව

පාරම්පරික වෛද්‍ය නැකැත්ගෙදර සෝමනන්ද

රාවණා යුගයේ සිට පැවත එන වෙද පරම්පරාවක් වන නැකැත්ගෙදර වෙද පරම්පරාව කැඩුම් බිඳුම් දේශීය චිකිත්සාව පිළිබඳ විශේෂතාවක් උසුලයි. මීට අමතර ව ස්නායු රෝග, සහජ කොරතාව (පංගුතාව) හා සියලු සන්ධිගත රෝග සඳහා ද මෙම පරපුරෙහි ප්‍රතිකාර පද්ධති පවතී.

අස්ථි භග්නයක් සිදු වී රෝගියෙකු ප්‍රතිකාර සඳහා පැමිණි විට රෝග විනිශ්චය, රෝගියාගේ මානසික තත්ත්වය පරීක්ෂා කිරීම, නාඩි ක්‍රමවේද භාවිතය හා රෝගී ස්ථාන පරීක්ෂාව මගින් රෝගයේ නියම ස්වභාවය නිර්ණය කෙරේ. අස්ථි වෙන් වී ඇති අවස්ථාව කැඩුමක් ලෙසත් අස්ථි පුපුරා වෙන් නොවී පවතින විට එය බිඳුමක් ලෙසත් හැඳින්වේ.

අස්ථි කැඩීමක දී භග්නය සකසා මහ හන්දි තෙල හා මැල්ලුම ඖෂධ වශයෙන් තබා වියළි පොල්පිති කැබැල්ලක් ආධාරයෙන් භග්නය සකස් කිරීම ස්ථිර කර වෙළුම් යොදයි. රෝගයේ ස්වභාවය අනුව (තැලීම්, තුවාල) සලකා බලා තෙල් ආලේප කර රෙදි කැබැල්ලක් තබා මැල්ලුම තබා ඔතනු ලැබේ. මේ සඳහා රහස් වෙළුම් ක්‍රම භාවිත කරනු ලැබේ. පිටතින් පතුරු තැබීම සිදු කර නාඩි ගමන් ගන්නා වේගයට තද කිරීමක් කරයි. කැඩුන ස්ථාන එක්කර එක පතුරක් බඳී. ඉන්පසු පැය 06ක් මැල්ලුම බැඳ තබයි. පතුරු තැබිය යුත්තේ සම ආරක්ෂා වන පරිදිය.

ඉන් පසු රෝගී පරීක්ෂාව සිදුකර දෙවන මැල්ලුම නිර්දේශ කරයි. අවස්ථාව අනුව පැණි පත්තු, ගුගුල් හා කෂාය ඖෂධ යොදයි. වයස් සීමාව අනුව තෙවැනි මැල්ලුමක් බැඳීම අවශ්‍ය හෝ අවශ්‍ය නොවන බව තීරණය කරයි. තරුණ රෝගීයෙකු සඳහා මෙසේ තුන්වන මැල්ලුමක් නිර්දේශ කරන අතර එහි දී ඇතුළත පතුර ඉවත් කරයි. නාඩි පරීක්ෂා කිරීම මගින් භග්නයේ සවිවීම පරීක්ෂා කර බැලේ. ඉන් පසු පැණියක් සකස් කර එය ආලේප කර පතුරු 04ම එකට බඳී.

දින 05කට පසු පතුරු ඉවත් කර ඖෂධීය දියරයකින් සෝදයි. අස්ථිය මේ වන විට 50%ක් බද්ධ වී ඇත්නම් රෝගියාගේ මානසික මට්ටම අනුව භග්න ස්ථානය පරීක්ෂා කර බලා පත්තුවක් සකස් කර උදේට පත්තුව ද සවසට මැල්ලුම ද බඳී.

කාලයත් සමග සන්ධි ක්‍රියාත්මක නොකිරීම නිසා කැල්සියම් තැන්පත්වීම වැළක්වීම සඳහා තැවීම සිදු කරයි. එයින් නහර දුර්වලතාව ද මග හැරේ.

භග්නය 85%ක් සුව වූ විට සවසට මැල්ලුම බඳින අතර උදෑසනට තෙල්කිර යොදයි. එයින් භග්නය සම්පූර්ණයෙන් ම සුවවේ. තරුණ රෝගියෙකු සඳහා සම්පූර්ණ සුවය ලැබීමට දින 45ක් පමණ ගත වන අතර වයස අවු.50ක ට වැඩි අයකු සඳහා මාස 03ක පමණ කාලයක් ගත වේ.

අස්ථි භග්නයක් නිසා අවයවයක (අත්/පා)කෙටි වීමක් සිදු වූවහොත් රෝගියා එක්තැන් කොට තබා වැලි කොට්ට හා පතුරු භාවිතයෙන් එම අවයවය ඇදීමකට ලක් කර එය නිවැරදි කිරීම ද මෙම පාරම්පරික දැනුමේ එක් අංගයකි.

විවෘත භග්නයක් නම් අස්ථියේ පිටතට පැමිණ ඇති කොටස මුළු දිගින්1/4ක් හෝ 1/2ක් වන අවස්ථාවලදී දෙපසට ඇද අස්ථි දෙක සවි කර තුවාලයට විරුද්ධ පසින් පතුරක් බැඳ ඔඩු තෙල තුවාලයට දමමින් තෙල් එරඬු බටයක් ආධාරයෙන් ඔඩු පිඹීම සිදුකරයි. තෙල් එරඬු බටයේ ඇත ඖෂධීය ගුණය නිසා විෂ බීජ ඇතුළු වීමක් සිදු නොවන අතර එයට මැල්ලුම්, පැණි පත්තු ක්‍රමවේදය ම භාවිත කරයි.

**මැල්ලුම් සඳහා යොදන ඖෂධීය ශාක**

ඇසතු, නා, නුග, බෝ, අට්ටික්කා, කොටදිඹුල

**තෙල්සඳහා**

අංකෙන්ද, කංසා, බිංකොහොඹ, නවහන්දි ආදී අමු ඖෂධ භාවිත කරයි.

**තැවිලි පොට්ටනි සඳහා**

වියළි ඖෂධ භාවිතකරයි.

මීට අමතරව සත්ත්ව කොටස් වශයෙන් මුව අං, ගෝන අං කුඩු, ඇත් දත් කුඩු ආදී ඖෂධ භාවිත කරයි.

පිටගැස්ම වැළැක්වීමට ගංසූරිය පොතු, තණ හාල් මිශ්‍ර කසාය වර්ග යොදයි.

**සහජ පංගුතාවය සඳහා**

උපතේ සිට පාදවල විකෘතිතා සහිත දරුවන්ගේ පාද වලට උපන් කොර තෛලය නැමැති තෙල පෙඟවූ පිරිසිදු මෘදු රෙදි හා පුළුන් දින 20ක් පමණ බැඳීමෙන් සුව කරන චිකිත්සා ක්‍රමයක් මෙම පරම්පරාව සතුව පවතී.

අවු. 01ට වැඩි දරුවන් සඳහා ලෝහවලින් සකස් කළ පාවහන් පැළඳවීමෙන් හා මැල්ලුම් පත්තු වැනි දේ භාවිතයෙන් චිකිත්සා කරනු ලැබේ.